ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් Regional Center for Strategic Studies ආයතනය විසින් 2023 මාර්තු මස 8 වන දින වැඩසටහනක් Zoom තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී. මෙම වැඩසටහන නිම්මි ජයතිලක විසින් මෙහෙය වන ලදී. මෙහි පිළිගැනීමේ කතාව කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යය නයනි මැලගොඩ මහත්මිය විසින් ඉදිරිපත් කරන ලදී. මෙම වැඩසටහනේ සම්පත්දායකයින් ලෙස කටයුතු කරනු ලබන්නේ කණිෂ්කා කොඩිතුවක්කු RCSS හි පර්යේෂණ සීමාවාසිකයෙකි. ඇය ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (ගෞරව) උපාධියක් ලබා ඇත. නිම්මි ජයතිලක RCSS හි වැඩසටහන් නිලධාරිනියකි. ඇය ඉන්දියාවේ පොන්ඩිචෙරි විශ්ව විද්‍යාලයෙන් දකුණු ආසියානු අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් සහ ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ඉංග්‍රීසි පිළිබඳ BA (ගෞරව) උපාධියක් ලබා ඇත.හරිනි වීරසිංහ RCSS හි පර්යේෂණ සීමාවාසිකයෙකි. ඇය ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රවේදී උපාධිය (ගෞරව) හදාරන අවසන් වසරේ ශිෂ්‍යාවකි. එමෙන්ම කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය පවිත්‍රා ජයවර්ධන මැතිණිය ද මෙම වැඩසටහනට සහභාගී විය.

මෙම දේශනය කොටස් හතරකින් යුක්ත විය. කණිෂ්කා කොඩිතුවක්කු විසින් කාන්තා දිනයේ ආරම්භය හා විකාශය පිළිබදවත් ,කාන්තා දිනයේ තේමා පාඨය පිළිබදවත් ,කාන්තා දිනය සමරන්නේ කුමක් නිසාද යන්න පිළිබදවත්, ලංකාව තුළ කාන්තාවට තිබෙන තත්ත්වය (ප්‍රතිශත අනුව) පිළිබදවත් , හරිනි වීරසිංහ විසින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සම්බන්ධයෙන් නීතිමය පියවර වල සාර්ථක අසාර්ථක භාවය තිරසාර සංවර්ධන ඉලක්ක අංක 5 පදනම් කරගෙන තර්කානුකූලව ඉදිරිපත් කිරීම පිළිබඳවත් ,නිම්මි ජයතිලක විසින් ජාත්‍යන්තර කාන්තා දිනයේ තේමාව, සමානාත්මතාවය සහ සාධාරණත්වය අතර වෙනස, ඉතිහාසයේ උදාහරණ, සමානාත්මතාවය සහ සාධාරණත්වය දේශපාලන මූලධර්ම, කාන්තා උන්නතිය සඳහා සාධාරණත්වය යෙදීම, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සහ කාන්තාව, සාධාරණත්වය මත පදනම් වූ සහ සමානාත්මතාවය පදනම් වූ විසඳුම් පිළිබඳවත් ඉදිරිපත් කරන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පවිත්‍රා ජයවර්ධන මැතිනිය විසින් ඉහත කී සියලුම මාතෘකා සංක්ෂිප්ත කොට ආවරණය කරන ලදී.

මෙම වැඩසටහනට නිමා කිරීමට මත්තෙන් වැඩසටහනට සහභාගී වූ සාමාජිකයින් ඔවුන්ගේ අදහස් අප හා සමග බෙදා ගන්නා ලදී. එහි දී ඔවුන්ගෙන් පළවූ අදහස් ලෙසට, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ශ්‍රී ලංකවේ 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ මානව හිමිකමක් ලෙසට පිළිගෙන ඇති බවට නොදැන ඇති බවත්, වැන්දඹු සහ දික්කසාද කාන්තාවන්ට උදව් කිරීම සඳහා නීතිමය පියවර ගත හැකි ද යන්න පිළිබඳවත්, මෙම වැඩසටහනෙහි ඉතා හොඳ බවත් වටිනා අදහස් ඉදිරිපත් කළ බවත්, මෙම වැඩසටහනට සම්බන්ධ වූ පුද්ගලයින්ගේ අදහස් ලෙසට දැක්විය හැකිය. මෙලෙස අප ආයතනය විසින් කාන්තා දිනය වෙනුවෙන් සංවිධානය කරනු ලැබූ මෙම වැඩසටහන සාර්ථක අයුරින් නිමා කෙරුණි.